විගණකාධිපති චක්‍රලේඛ අංක - 2017/11 2017 පෙබරවාරි දින

විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72

පොල්දූව පාර

බත්තරමුල්ල

සියළුම අංශ ප්‍රධානීන් , විගණන අධිකාරි හා කණ්ඩායම් භාර නිලධාරින් වෙත,

**විගණිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා විගණන කාර්යයන් සඳහා යොදා ගැනීම**

---

විගණිත ආයතනවල අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තාවල රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතු අතර, විගණන කටයුතු සඳහා එම වාර්තා උපයෝගී කර ගැනීමේදී එම රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා වන බව තහවුරු වන පරිදි කටයුතු කිරීම අපගේ වගකීමයි.

ඒ අනුව අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තා සම්බන්ධව පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බව දන්වා සිටිමි.

1. විගණන අධිකාරි / කණ්ඩායම් භාර නිලධාරි විසින් පෞද්ගලිකව හෝ ඔවුන්ගේ අධීක්ෂණය යටතේ වෙනත් නිලධාරියකු විසින් විගණිත ආයතනයේ කාර්යාලයේදී එම වාර්තා පරිශීලනය කොට අවශ්‍ය ඡායා පිටපත් ලබාගැනීමට කටයුතු කිරීම.

2. ශාඛාව වෙත වාර්තා ගෙන්වා ගනු ලබන්නේ නම් හෝ ශාඛාව වෙත එවනු ලබන්නේ නම් විගණන අධිකාරිවරයා / කණ්ඩායම්භාර නිලධාරි විසින් හෝ ඔවුන්ගේ අධීක්ෂණය යටතේ වෙනත් නිලධාරියෙකු විසින් එම වාර්තා පෞද්ගලිකවම අධ්‍යයන කොට වෙනත් නිලධාරීන්ට පරිශීලනයට ඉඩ නොතබා සුරක්ෂිතව තම භාරයේ තබා ගත යුතුය.

විගණකාධිපති